# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 161/7—1975 අප්‍රේල් 29 වැනි අඟහරුවාදා — 1975.04.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : අයි. 108 (2)

(131 වන අධිකාරිය වන) 1957 අංක 14 හා අංක 62 සහ 1962 අංක 4 දරන කාර්මික ආරවුල් (සංශෝධිත) පනත්වලින් සංශෝධිතවූ (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත සමඟ කියවා) කාර්මික ආරවුල් පනතේ 22 වන වගන්තියෙන් ජනාධිපති තුමා වෙත පැවරී ඇති බලතල පිට විලියම් ගොපල්ලව වන මම, මෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති පුද්ගලයා 1975 මාර්තු 01 වෙනි දින වැඩබලන ජනාධිපතිතුමාගේ නියෝගය පරිදි 1975 මාර්තු 03 වෙනි දින පටන් එක් වර්ෂයක් සඳහා පත් කළ 1975 මාර්තු 01 වෙනි දින අංක 153/1 දරන ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ මණ්ඩලයට අතිරේකව මෙයින් පත් කරමි.

වි. ගොපල්ලව,
ජනාධිපති.

1975 අප්‍රේල් මස 28 වැනි දින,
කොළඹ,
ජනාධිපතිතුමාගේ කාර්යාලයේ දිය.

උපලේඛනය

හෙන්රි විජේතිලක

4—566

---

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථා පනත

2 වැනි වගන්තිය යටතේ වූ නියෝගය

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථා පනතේ 2 හා 10 වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශීය හා දේශීය වෙළඳ ඇමති, ටිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් ජයලත් සුරනිමල අමරසේකර මහතා ශ්‍රී ලංකා රජයේ වාණිජ (රෙදිපිළි) නීතිගත සංස්ථාවේ—සලුසලේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් මෙම නියෝගයෙන් පත් කරමි.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1975.04.22 දින,
කොළඹ 2.

4—505


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

1 A—ජ 13480—4,490 (75/03)